# නිවේදනයයි

## මහපොළ ශිෂ්‍යත්වලාභී සියලුම සිසුන්ගේ දැනගැනීම පිණිසයි

## මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව මාසික වාරික ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීම

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව මාසික වාරික ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 02/2019 චක්‍රලේඛනය සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල විසින් එවා ඇති 2019.02.11 සහ 2019.02.28 දිනැති ලිපි මගින් දැනුම් දී ඇති පරිදි නව ගෙවීම් ක්‍රමය 2019 මැයි මස (2019 අප්‍රේල් මස වාරිකය) සිට ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කර ඇත.

මෙම ක්‍රමය යටතේ සිසුන්ගෙන් අත්සන් ලබා නොගන්නා බැවින් සිසුන් අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වීම සම්බන්ධයෙන් අදාළ අංශාධිපතිගේ හා පීඨාධිපතිවරයාගේ නිර්දේශ පදනම් කරගෙන ගෙවීම් සඳහා නිර්දේශ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල වෙත යවනු ලැබේ.

ඒ අනුව සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වීම 80% අනිවාර්ය වන අතර, ඒ පිළිබඳව පරීක්ෂා කර බලා අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වීම 80% නොමැති සිසුන්ගේ ලේඛනයක් සෑම මසකම අදාළ පීඨාධිපතිවරයා විසින් ශිෂ්‍යසේවා අංශය වෙත එවනු ලැබේ.

සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වීම පරීක්ෂා කරනු ලබන්නේ ගෙවීමට අදාළ මාසයට පෙර මාසයේ පැමිණීම පදනම් කරගෙන බවද මෙයින් දැනුම් දෙමි.

මෙම ක්‍රමය යටතේ මහපොළ ශිෂ්‍යත්ව වාරික මුදල් අදාළ මාසයට පසු මාසයේ 15 දින වනවිට ඔබගේ ගිණුමට බැර කරන අතර, ඒ බව කෙටි පණිවිඩයක් මගින් මහපොළ ශිෂ්‍යත්ව අරමුදල වෙතින් ඔබ වෙත දැනුම් දෙනු ඇත.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍යසේවා,
2019.04.02